# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2036/40 - 2017 සැප්තැම්බර් මස 15 වැනි සිකුරාදා - 2017.09.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/HAR/4/2/2/21.
*ඉඩම් අමා. යොමු අංකය* : 4/3/8/2013/CC/54.

මහ/කටු/කුරුඳුගොල්ල මධ්‍ය මහා විද්‍යාලය සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ කුරුඳුගොල්ල ගමේ පිහිටි, මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක මහ 6709 දරන පිඹුරේ දැක්වෙන හෙක්ටයාර් 0.0758 ක් පමණ වූ ඉඩම් කැබලි 03.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: පරගහමුලකුඹුර; හිමිකම් කියන අය: ඒ. ආර්. එම්. නවාස්, 37/4, කුරුඳුගොල්ල, වැරැල්ලගම; ප්‍රමාණය: හෙක්. 0.0654.

02. **කැබලි අංක 2**
ඉඩමේ නම: පරගහයට පැල; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0092.

03. **කැබලි අංක 3**
ඉඩමේ නම: පරගහමුලකුඹුර; හිමිකම් කියන අය: ඒ. ආර්. එම්. නවාස්, 37/4, කුරුඳුගොල්ල, වැරැල්ලගම; ප්‍රමාණය: හෙක්. 0.0012.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 11 වැනි දින පෙ. ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 දෙසැම්බර් මස 11 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. එම්. ජේ. කේ. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2017 සැප්තැම්බර් මස 10 වැනි දින,
නුගවෙල හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 876


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 26273 - 32 - (2017/09)
)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.